ස්වදේශ කටයුතු චක්‍රලේඛ : 07/2017

මගේ අංකය: HAF 1/12/GR
ස්වදේශ කටයුතු අමාත්‍යංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2017.08.14

සියලුම දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත
සියලුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත

**ස්වදේශ කටයුතු අමාත්‍යංශයට අනුයුක්ත සංවර්ධන නිලධාරි රාජකාරි පැවරීම**

ස්වදේශ කටයුතු අමාත්‍යංශයට අනුයුක්තව දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සංවර්ධන නිලධාරීන් රාජකාරිවලට අනුයුක්ත කිරීමේදී පහත සඳහන් කරුණු අනුව ක්‍රියා කළ යුතුය.

I. ආපදා තත්ත්වයකදී හෝ වෙනත් විශේෂ අවස්ථාවකදී හැර සංවර්ධන නිලධාරීන් වෙත සංවර්ධන විෂයට අදාල නොවන වෙනත් රාජකාරි පැවරීමෙන් වැළකීම හා දැනටමත් එම නිලධාරීන් වෙත එලෙස වෙනත් රාජකාරි පවරා ඇත්නම් එම රාජකාරි වලින් නිදහස් කිරීමට කටයුතු කිරීම.එසේ වුවද, නිලධාරීන්ගේ කැමැත්ත මත සංවර්ධන විෂයට අදාල නොවන වෙනත් රාජකාරි නිලධාරීන් වෙත පැවරිය හැකිය.

II. වසම්වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් බදාදා දින අනිවාර්යෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තා කළ යුතුය. කාර්යාලයීය අවශ්‍යතාවය අනුව කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර ඔවුන්ගෙන් ඉටුවිය යුතු රාජකාරි නිමවූ පසුව නැවත ක්ෂේත්‍රයේ රාජකාරි සඳහා මුදාහැරිය හැක.

III. සංවර්ධන නිලධාරීන් සඳහා ගෙවිය යුතු දීමනා ප්‍රමාදයකින් තොරව එම නිලධාරීන් වෙත ගෙවීමට කටයුතු කිරීම

නිල්ද අල්විස්
ලේකම්
ස්වදේශ කටයුතු අමාත්‍යංශය